**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය**
උපදේශක චක්‍රලේඛය 2004/පුස/02 (අ)(සංශෝධිත 2024)

**සංස්කෘතික මධ්‍යස්ථාන පුස්තකාලයන්හි**
**"ඔක්තෝබර් - ජාතික කියවීමේ මාසය වැඩසටහන" ක්‍රියාත්මක කිරීම**

## 01. හැඳින්වීම

2004 වසරේ සිට සෑම වර්ෂයකම ඔක්තෝබර් මාසය ජාතික කියවීමේ මාසය ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2024 ඔක්තෝබර් මාසයට යෙදෙන ජාතික කියවීමේ මාසයට සමගාමීව කියවීම ප්‍රවර්ධනය සඳහා **විශේෂ වැඩසටහන්** සහ **විශේෂ ව්‍යාපෘති** ක්‍රියාත්මක කරන මෙන් සියලුම සංස්කෘතික මධ්‍යස්ථානවලින් ඉල්ලා සිටිනු ලැබේ. " **ලෝකය ජයගෙන ඇත්තේ කියවන මිනිසුන්ය** " යන තේමාව පදනම් කරගනිමින් මෙම වසරේ ජාතික කියවීමේ මාසය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත ය .

## 02. ව්‍යාපෘති කමිටුව

මෙහිදී වැඩසටහන් සංවිධානය කිරීම සඳහා කියවීමේ මාසයේ ව්‍යාපෘති කමිටුවක් පත් කර ගැනීම වඩා සුදුසු වේ. දැනට පුස්තකාල කමිටුවක් තිබේ නම් එම කමිටුව මඟින් හා පාඨක සමාජයේ සහභාගිත්වයෙන් මෙම කටයුත්ත සිදු කළ හැක. මේ සඳහා ප්‍රධාන මෙහෙයුම් කමිටුවක් පත්කර ගැනීම ද සුදුසු වන අතර එහි සංයුතිය පහත පරිදි විය යුතුය

- ආයතන ප්‍රධානියා/නියෝජ්‍ය ප්‍රධානියා - කමිටු සභාපති
- පුස්තකාල භාරකරු - කමිටු ලේකම්
- විෂය භාර නිලධාරීන්
- ආයතන ප්‍රධානියා විසින් නම් කරන වෙනත් නිලධාරීන් දෙදෙනෙක්

## 03. ක්‍රියාත්මක කළ හැකි විශේෂ වැඩසටහන්

- සිසුන්ගේ කියවීම් ප්‍රවර්ධනය උදෙසා තරඟ සංවිධානය කිරීම.
- ජංගම පුස්තකාල සේවා පැවැත්වීම.
- සාමාජිකයන්ගේ නිර්මාණශීලී හැකියාවන් එළිදැක්වෙන නිර්මාණ ඇතුළත් සඟරා, බිත්ති පුවත්පත් එළි දැක්වීම.
- ප්‍රදේශයේ මහජන පුස්තකාල සමඟ එක්ව කියවීම් ප්‍රවර්ධනය සඳහා සුදුසු සහයෝගිතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සාහිත්‍ය කෘති සම්බන්ධව විද්වත් සාකච්ඡා පැවැත්වීම.
- ගෘහ පුස්තකාල ආරම්භ කිරීම සම්බන්ධව සාමාජිකයන් දැනුවත් කිරීම.
- පොත් ප්‍රදර්ශන පැවැත්වීම.
- සම්මන්ත්‍රණ හා දේශන පැවැත්වීම.
- දරුවන්ගේ රසවින්දනය ඉහළ නැංවීම සඳහා රසවින්දනාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- වෙනත් නිර්මාණශීලී කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සිදු කිරීම.
- කියවීම් කඳවුරු සංවිධානය කිරීම

## 04. අරමුදල්

මේ සඳහා විශාල වශයෙන් මුදල් යෙදවීම් අවශ්‍ය නොවේ. ආයතනයේ පොදු අරමුදලින් කොටසක්ද පුස්තකාල අරමුදලින් කොටසක්ද යෙදවීම ප්‍රමාණවත්ය.

## 05. වාර්තාව සකස් කිරීම

සිදු කරන ලද සියලුම වැඩසටහන් පිළිබඳ පැහැදිලි ක්‍රමවත් වාර්තාවක් සකස් කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ***2025 පෙබරවාරි මස 28*** වන දින හෝ ඊට පෙර ***අංශ ප්‍රධාන, ව්‍යාප්ති සේවා අංශය, ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, අංක 14, නිදහස් මාවත, කොළඹ 07*** යන ලිපිනයට එවිය යුතුය.

ජයග්‍රාහී පුස්තකාල තෝරා ගැනීම සඳහා මූලිකව සලකා බලනු ලබන වාර්තාව සකස් කිරීමේදී, ඉහත දක්වන ලද වැඩසටහන් ඇතුළුව කියවීම් ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සිදුකරන ලද වැඩසටහන් සඳහා පමණක් ලකුණු ලබාදීමේ ක්‍රමවේදයක් අනුගමනය කරනු ලැබේ. මුළු ලකුණුවලින් 75% ක් පුස්තකාලය විසින් සිදු කරන කියවීම් ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ද වෙනත් වැඩසටහන් සඳහා 25% ක ලකුණු ප්‍රමාණයක් ද හිමිවේ.

වාර්තාව සකස් කිරීමේදී පිටකවරය /පොතේ බැම්ම වැනි දේ සඳහා අමතර කාලයක් හා මුදලක් වැය කිරීම අවශ්‍ය නොවේ.පුස්තකාලය විසින් ජාතික කියවීමේ මාසයේ තේමාවට අනුව සිදුකරන ලද වැඩසටහන් සහ අදාළ වර්ෂය පුරා සිදුකළ වැඩසටහන්වල තොරතුරු වෙන් වෙන්ව **ඡායාරූප හා තහවුරු කළ හැකි වෙනත් සාධක සහිතව විධිමත් අයුරින්** ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය

## 06. ඇගයීම

ජාතික කියවීමේ මාසය 2024 ඵලදායි වැඩසටහන් ඉටු කළ පුස්තකාල වෙත 2025 ජාතික කියවීමේ මාසය සම්මාන ප්‍රදානෝත්සවයේ දී සම්මාන හා සහතිකපත් පිරිනැමීමට කටයුතු කරනු ලැබේ.ජයග්‍රාහී පුස්තකාල හා ඇගයීම් ලබන පුස්තකාල පිළිබඳ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති

මහාචාර්ය නන්ද ධර්මරත්න
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
14, නිදහස් මාවත,
කොළඹ 07


විමසීම් - දුරකථන අංකය - 0112-688855
ෆැක්ස් - 0112685201
විද්‍යුත් තැපැල - libdev@mail.natlib.lk
වෙබ් පිටුව - www.natlib.lk